ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,362—1962 ඔක්තෝබර් 26 වැනි සිකුරාදා—1962.10.26

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි.)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙන ම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොද ඇත.)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ආදිය ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | 1475 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය | 1475 |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 1476 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 1476 |
| මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලඞකා මහා බැංකුවේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 1479 |
| "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 435**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පහත සඳහන් පත් කිරීම් කරන ලෙස නියම කර ඇත්තේ ය:—

ඒ. 269/62.

1962 සැප්තැම්බර් මස 10 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක වී. පණ්ඩිත මහතා ගුවන් විදුලි හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ සහකාර ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂක ජනරාල් වශයෙන් වැඩ බැලීමට.

ඒ. 252/62.

1962 සැප්තැම්බර් මස 14 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ශ්‍රේෂ්ඨාධිකරණයේ තුන්වෙනි නියෝජිත රෙජිස්ට්‍රාර් බී. ආර්. සී. පෙරේරා මහතා ශ්‍රේෂ්ඨාධිකරණයේ දෙවෙනි නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් වශයෙන් වැඩ බැලීමට.

1962 සැප්තැම්බර් මස 14 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ශ්‍රේෂ්ඨාධිකරණයේ හතර වෙනි නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුරෙහි වැඩ බලන ජී. ඒ. ඇල්. ඇම්. වික්‍රමසිංහ මහතා ශ්‍රේෂ්ඨාධිකරණයේ තුන්වෙනි නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් වශයෙන් වැඩ බැලීමට.

1962 සැප්තැම්බර් මස 14 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ශ්‍රේෂ්ඨාධිකරණයේ වැඩ බලන තාවකාලික පස්වෙනි නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ආර්. සී. වික්‍රමසිංහ මහතා ශ්‍රේෂ්ඨාධිකරණයේ හතරවෙනි නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් වශයෙන් වැඩ බැලීමට.

එන්. පී. විජයරත්න,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 ඔක්තෝබර් මස 22 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් කොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.

10-1095

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 436**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේ ය:—

අංකය: ජේඑස් සී/පීපී/11/62.

ඒ. එල්. එස්. සිරිමාන මහතා 1962 ඔක්තෝබර් මස 10 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු කොළඹ දිස්ත්‍රික් නඩුකාර වශයෙන්.

අංකය: ජේඒ/11/48.

පී. ඒ. ද එස්. සේනාරත්න මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 ඔක්තෝබර් මස 12 වැනි දින සිට කොළඹ දිස්ත්‍රික් උසාවියේ අංක 9216/එල් සහ 6252/එම්බී දරණ නඩු අසා අවසාන කිරීම හා තීන්දු දීම සඳහා කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: ජේඒ. 19/48.

එම්. හුසේන් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 නොවැම්බර් මස 23 වැනි දින සිට ගාල්ලේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 21708 සහ 15670 දරණ නඩු අසා අවසාන කිරීම සහ තීන්දු දීම සඳහා සහ 1962 ඔක්තෝබර් මස 23 වැනි දින සිට ගාල්ලේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 21465 දරණ ප්‍රාථමික නඩුව අසා අවසාන කිරීම සහ තීන්දුව දීම සඳහා ගාල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ ගාල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: ජේඑල්. 57.ඒ/57.

කේ. සී. ඕ. එස්. එම්. සෙනෙවිරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඒ. එම්. අයි. ගුණරත්න මහතා 1962 ඔක්තෝබර් මස 20 වැනි දින සිට 22 වැනි දින දක්වා සහ 26 වැනි දින සිට 30 වැනි දින දක්වා ගම්පොල ක්‍රියා කරන පිණිස මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට සහ ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක ටවුන් වෙස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 51. ඒ/54.

ටී. ජේ. රාජරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, සී. එච්. උදලාගම මහතා 1962 ඔක්තෝබර් මස 22 වැනි දින සිට 26 වැනි දින දක්වා කෑගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධූරයට සහ කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේඑල්. 42. සී/54.

ජී. සී. නයිල්ස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ජේ. ඩබ්ලිව්. වික්‍රමසිංහ මහතා 1962 ඔක්තෝබර් මස 22 වැනි දින සිට 26 වැනි දින දක්වා මාතර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට සහ මාතර අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධූරයට.

අංකය : ජේඒ. 56/48.

ඒ. සී. කනගසිංහම් මහතා 1962 ඔක්තෝබර් මස 17 වැනි දින සිට ත්‍රිකුණාමලේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 1741 දරණ ප්‍රාථමික නඩුව සඳහා ත්‍රිකුණාමලේ මහෙස්ත්‍රාත් තැනගේ සාක්ෂි සටහන් කිරිම සඳහා ත්‍රිකුණාමලේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට.

අංකය : ජේඑල්. 7. ඒ/51 (1).

ඒ. ඔ. එස්. දිසානායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එස්. පී. විජයතිලක මහතා 1962 ඔක්තෝබර් මස 26 වැනි දින සිට 31 වැනි දින දක්වා මාතලේ ක්‍රියා කරන පිණිස මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට සහ මාතලේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධූරයට.

අංකය : ජේඑල්. 27. ඒ. 3/61.

මොහමඩ් හුසේන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඩබ්ලිව්. ද සිල්වා මහතා 1962 නොවැම්බර් මස 23 වැනි දින කළුතර අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධූරයට සහ කළුතර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේඑල්. 23. ඒ/58.

ඒ. ඩබ්ලිව්. ගුණරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ටී. ජේ. සී. පීරිස් මහතා 1962 ඔක්තෝබර් මස 29 වැනි දින පානදුරේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධූරයට සහ පානදුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේඑල්. 63.ඒ/58.

ජේ. ජී. එල්. ස්වාරිස් මහතා නැවත වැඩ බාරගන්නා තුරු හෝ නැවත නියමයක් කරනතුරු, එල්. වී. බී. ද ජකොලයින් මහතා 1962 ඔක්තෝබර් මස 25 වැනි දින සිට අවිස්සාවේල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට සහ අවිස්සාවේල්ලේ දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : පීඑල්/ එම්. 5/54.

ජී. එම්. මන්‍යපෙරුමාල් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ආර්. වී. විල්වරාජා මහතා 1962 ඔක්තෝබර් මස 26 වැනි දින සිට 31 වැනි දක්වා වවුනියා අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධූරයට සහ වවුනියා අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : පීඑල්/ඩබ්ලිව්. 10/53.

ට්. බී. වැත්තෑව් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. ඩබ්ලිව්. ඒ. ඉමැනුවෙල් මහතා 1962 ඔක්තෝබර් මස 19 වෙනි, 23 වෙනි, 24 වෙනි, 29 වෙනි සහ 30 වෙනි දිනයන්හි කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති වශයෙන් හා වන්නිහත්පත්තුවේ, කටුගම්පොල හත්පත්තුවේ සහ හිරියාල හත්පත්තුවේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එෆ්ජ්. 2/62.

ටී. එච්. ප්‍රනාන්දු මෙනෙවිය නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, බී. එල්. අබේරත්න මහතා 1962 ඔක්තෝබර් මස 30 වෙනි දින රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිටි කෝරලේ සහ කුකුල් කෝරලේ ගම්බද උසාවි සභාපති වශයෙන් හා නවදුන් කෝරලේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී. 9/59.

ජේ. පැට්රික් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. ඒ. සී. එම්. මීරා සාහිබෝ මහතා 1962 ඔක්තෝබර් මස 22 වැනි දින සිට 24 වැනි දින දක්වා සහ 26 වැනි දින මඩකලපු දිස්ත්‍රික්කයේ අක්කරයි පත්තුවේ සහ පනාමා පත්තුවේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඒඒ. 5/57.

ඒ. ජේ. සහීඩ් මහතා 1962 ඔක්තෝබර් මස 26 වෙනි දින මතුගම ගම්බද උසාවියේ අංක 43 සහ 89 දරණ අපරාධ නඩු ඇසීම සඳහා, කළුතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර සහ බටහිර පස්දුන් කෝරලයන්හි සහ කළුතර තොටමුනේ ගම්බද උසාවි අතිරේක සභාපති වශයෙන්.

අංකය : පීඑල්/අයි. 4/52.

ජේ. ඊ. ඉලන්ගන්තිලක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, පී. එස්. මහලේකමෙ මහතා 1962 ඔක්තෝබර් මස 16 වෙනි දින මහනුවර දිස්ත්‍රික්කයේ තුම්පනේ, හාරිස්පත්තු සහ හේවාහැට සහ උඩ හේවාහැට ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

ඇන්. ඒ. ද ඇස්. විජේසේකර,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 ඔක්තෝබර් මස 18 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංක 573,
කොළඹ 12.

10-996

## වෙනත් පත් කිරීම් ආදිය

**1962 අංක 437**

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ ගරු අධිකරණ අමාත්‍ය වරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින්—

(1) ඒ. එල්. සමරසේකර මහතා මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු සහ නිලනොලත් මහෙස්ත්‍රාත් වරයෙකු වශයෙන් ද,

(2) ජේ. එල්. තම්බිරාජා මහතා මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු සහ නිලනොලත් මහෙස්ත්‍රාත් වරයෙකු වශයෙන් ද,

(3) සී. එම්. එල්. ද සිල්වා මහතා නුවරඑළිය අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු සහ නිලනොලත් මහෙස්ත්‍රාත් වරයකු වශයෙන් ද,

(4) ඒ. එම්. දිසානායක මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

(5) ඩී. සී. හේවාවිදාන මහතා ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

(6) එස්. ඒ. ද සිල්වා මහතා කුරුණෑගල අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද

පත් කර ඇත්තේ ය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩ බලන
ස්ථිර ලේකම් තැන.

1962. 10. 22 දින,
කොළඹ අධිකරණ අමාත්‍යාංශයේදීය.

10—1104

## ආණ්ඩුවේ නිවේදන

අ. ආ. කා. අංකය : ඇල් 91.

කෘ. ඉ. වා. හා වි/අමා. අංකය : ජේ. 258 (බී.ආර්)

ඉඩම් පවරා ගැනීමේ පනතේ (460 වැනි අධිකාරයේ) 19 (1) වැනි වගන්තියේ විධිවිධාන යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ගරු ඇමතිතුමන්ගේ උපදෙස් පිට, අග්‍රාණ්ඩුකාරතුමන් විසින් පී. ආර්. ගුණසේකර මහතා 1962 ඔක්තෝබර් 15 වැනි දින සිට, අවුරුදු 3 ක කාලයක් සඳහා, එහි සඳහන් වන පරිදි ඇපැල් නඩු විසඳීම පිණිස වූ විවේචන මණ්ඩලයේ නීතිඥ සාමාජිකයෙකු වශයෙන් පත් කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

සී. ජ. වල්පිට,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1962 ඔක්තෝබර් 22 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේදී.

10-1114

ඇල්.ඩී.—බී. 98/38.

## ලංකා සේවිංස් බැංකු ආඥාපනත

(399 වෙනි අධිකාරය වන) ලංකා සේවිංස් බැංකු ආඥාපනතෙහි 12 වෙනි වගන්තිය යටතෙහි, ලංකා සේවිංස් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්පාදනය කරනු ලැබ මුදල් ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබූ ව්‍යවස්ථාව.

හ. ෂ. අමරසිංහ,
සථිර ලේකම්,
මුදල් අමාත්‍යාංශය.

1962.10.18, කොළඹ.

### ව්‍යවස්ථාව

1928 නොවැම්බර් 30 වෙනි දින අංක 7,676 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ ගෙවල් සහිත ඉඩම්වල ඇප පිට දෙනු ලබන ණය වලට අදාළ ව්‍යවස්ථා, පහත සඳහන් අලුත් ව්‍යවස්ථාව ඒ ව්‍යවස්ථා වල අගට එකතු කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"10 (1) පෙරාතුව වූ ව්‍යවස්ථාවල විධිවිධානවලට හා මේ ව්‍යවස්ථා වෙහි පසුව එන විධිවිධානවලට ද යටත් ව, ප්‍රාදේශීය බල මණ්ඩලයක පරිපාලන සීමා තුළ ගෙයක් සෑදීමේ කාර්යය සඳහා ණයක් ඉල්ලුම් කරනු ලැබිය හැකි අතර එය ප්‍රදානය ද කරනු ලැබිය හැකි ය.

(2) (1) වෙනි ඡේදය යටතෙහි ණයක් සඳහා ඉල්ලුම්කරුවකු විසින්—

(අ) ප්‍රාදේශීය බල මණ්ඩලය විසින් අනුමත කරනු ලැබීමෙන් පසු ගෙයට අදාළ සැලැස්මවල් හා වැඩ විස්තර; හා

(ආ) ගෙය තැනීම පිළිබඳ විස්තර සහිත තක්සේරු කිරීම් හා වියදම්,

සැපයිය යුතු ය.

(3) ඉල්ලීම අනුමත කිරීමෙන් පසු, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වෙනත් අන්දමකින් අණ කරනු ලැබුවහොත් මිස, පහත සඳහන් පරිදි ණය මුදල කොටස් හතරකින් ගෙවිය යුතු ය :—

(i) පාත මාලය පමණක් තිබෙන ගෙයක් සම්බන්ධයෙන් නම්—

(අ) ගෙයි අත්තිවාරම සම්පූර්ණ කිරීමෙන් පසු අනුමත කරනු ලැබූ ණයෙන් හතරෙන් එක් කොටසකට සමාන ගණනක් ;

(ආ) වහලේ මට්ටම දක්වා ගෙයි බිත්ති ඉදි කිරීමෙන් පසු ණයෙහි හතරෙන් එක් කොටසකට සමාන තවත් ගණනක් ;

(ඇ) ගෙයි වහල සම්පූර්ණ කිරීමෙන් පසු ණයෙහි හතරෙන් එක් කොටසකට සමාන තවත් ගණනක් ; හා

(ඈ) ගෙය තැනීම සම්පූර්ණ කිරීමෙන් හා (268 වෙනි අධිකාරය වන) නිවාස හා නගර දියුණු කිරීමේ ආඥාපනතෙහි 15 වෙනි වගන්තිය යටතෙහි නිකුත් කරනු ලැබූ අනුකූලතා සහතිකයක් බැංකුවේ කළමනාකරු ඉදිරිපිට ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කිරීමෙන් පසු, ණයෙහි ඉතිරි හතරෙන් එකකට සමාන ගණනක් ; හා

(ii) එක මාලයකට වඩා ඇති ගෙයක් සම්බන්ධයෙන් නම්—

(අ) අත්තිවාරම සම්පූර්ණ කිරීමෙන් පසු අනුමත කරනු ලැබූ ණයෙන් හතරෙන් එකකට සමාන ගණනක්,

(ආ) ගොඩනැගිල්ල පළමුවෙනි මාලය තෙක් සෑදීමෙන් පසු ණයෙහි හතරෙන් එක් කොටසකට සමාන තවත් ගණනක්,

(ඇ) වහල සම්පූර්ණ කිරීමෙන් පසු ණයෙහි හතරෙන් එක් කොටසකට සමාන තවත් ගණනක්,

(ඈ) ගෙය තැනීම සම්පූර්ණ කිරීමෙන් හා (268 වෙනි අධිකාරය වන) නිවාස හා නගර දියුණු කිරීමේ ආඥාපනතෙහි 15 වෙනි වගන්තිය යටතෙහි නිකුත් කරනු ලැබූ අනුකූලතා සහතිකයක් බැංකුවේ කළමනාකරු ඉදිරිපිට ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කිරීමෙන් පසු, ණයෙහි ඉතිරි හතරෙන් එකකට සමාන ගණනක්.

(4) පළමුවෙනි කොටස ප්‍රදානය කිරීමට පෙර ඉල්ලුම්කරු විසින්—

(අ) ගෙය සෑදීම ආරම්භ කිරීමට සෑහෙන මුදල් තමා ළඟ තිබෙන බවට ද (3) වෙනි ඡේදයෙහි විස්තර කරනු ලැබූ පරිදි කොටස්වලින් ලැබෙන ණය මුදලෙන් එය සම්පූර්ණ කරන බවට ද අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත්කළ යුතු ය. තවද,

(ආ) එකී මණ්ඩලය විසින් නියම කළ හැකි කාලය තුළ ගෙය සෑදීම සම්පූර්ණ කරන බවට අධ්‍යක්ෂ මණ්ඩලයට පොරොන්දුවක් දිය යුතු ය.

(5) මේ නියෝගයෙහි, "ප්‍රාදේශීය බල මණ්ඩලය" යන්නෙන්,

(අ) කොළඹ මහා නගර සභාව හෝ,
(ආ) දෙහිවල-ගල්කිස්ස මහා නගර සභාව හෝ,
(ඇ) කෝට්ටේ නගර සභාව හෝ,
(ඈ) වත්තල නගර සභාව හෝ,
(ඉ) කොලොන්නාව නගර සභාව හෝ,
(ඊ) පෑලියගොඩ නගර සභාව අදහස් වේ."

10-1021

---

ඇල්.ඩී.—බී. 83/47.

## තුවක්කු ආඥාපනත

### 30 (1) වගන්තිය යටතේ කරනු ලබන ආඥාව

(182 වෙනි අධිකාරය වන) තුවක්කු ආඥාපනතේ 30 (1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති මෛත්‍රීපාල සේනානායක වන මම, මේ ආඥාවෙන්—

1. තම භාරයෙහි හෝ තම ස්වාමිත්වයෙහි තිබෙන බලපත්‍ර නොලත් තුවක්කු මේ ආඥාව ගැසට් පත්‍රයෙහි පළ කළ දින සිට දින 30 ක් ඇතුළත ළඟම පිහිටි පොලිස් ස්ථානයේ කාර්ය භාර නිලධාරියාට භාර දෙන ලෙස සියලු දෙනාටම නියම කරමි ; තවද

2. මේ ආඥාව මුළු දිවයිනටම අදාළ විය යුතු බවද ප්‍රකාශයට පත් කරමි.

මෛත්‍රීපාල සේනායක,
කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති.

1962 ඔක්තෝබර් මස 18 දින,
කොළඹ දී ය.

10-1094

---

## පඩි පාලක සභා ආඥාපනත

පඩිපාලක සභා ආඥාපනතේ (136 වැනි පරිච්ඡේදය) 9 වැනි වගන්තිය යටතේ ගරු කම්කරු හා ජනසතු සේවා ඇමතිතුමන් විසින් පහත සඳහන් පත්කිරීම් කරන ලද බව 1943 පඩිපාලක සභා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වැනි ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ :—

(1) මෝටර් රථ ගමනාගමන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයකුව සිට ඉල්ලා අස්වූ කේ. ඇම්. යූ. ජයනෙත්ති මහතා වෙනුවට එම පඩිපාලක සභාවේ සේව්‍ය නියෝජිත සාමාජිකයකු වශයෙන් පෙනී සිටීමට ඊ. බී. ද සේරම් මහතා, සහ

(2) මෝටර් රථ ගමනාගමන කර්මාන්තය සහ ගිණිපෙට්ටි සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවන්හි සාමාජිකයකුව සිට ඉල්ලා අස්වූ ඇස්. බී. යටවර මහතා වෙනුවට එම පඩිපාලක සභාවන්හි නම නියම කොට පත්කළ සාමාජිකයකු වශයෙන් පෙනී සිටීමට ජේ. ඇල්. සී. රුද්‍රිගු මහතා.

වී. ඇස්. ඇම්. ද මෙල්,
සථිර ලේකම්වරයා,
කම්කරු හා ජනසතු සේවා පිළිබඳ අමාත්‍යාංශය.

1962 ඔක්තෝබර් 6 වැනි දින,
කොළඹ දීය.

10-933

---

## පඩි පාලක සභා ආඥාපනත

### නිවේදනයයි

ගොඩනැගිලි, මුද්‍රණ සහ ඉංජිනේරු කර්මාන්ත පිළිබඳ පඩි පාලක සභාවන්හි සාමාජිකයකු වූ ඇල්. එච්. සුමනදාස මහතා 1962 සැප්තැම්බර් මස 1 වන දින සිට දිවයිනෙන් බැහැර සිටින කාලය තුළදී එම පඩි පාලක සභාවන්හි නම නියම කොට පත් කරන ලද සාමාජිකයෙකු ලෙස වැඩ බැලීමට පඩි පාලක සභා ආඥාපනතේ (136 වැනි අධිකාරය) 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු හා ජනසතු සේවා ඇමතිතුමන් විසින් ඩී. ඕ. පී. ප්‍රනාන්දු මහතා පත් කරන ලද බව වඩී 1943 පඩි පාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

වී. ඇස්. ඇම්. ද මෙල්,
කම්කරු හා ජජනසතු සේවා අමාත්‍යාංශයේ
සථිර ලේකම්වරයා.

1962 ඔක්තෝබර් මස 16 වැනි දින,
කොළඹ දීය.

10-946

## 1958 අංක 45 දරණ විද්‍යොදය විශ්ව විද්‍යාලය හා විද්‍යාලංකාර විශ්ව විද්‍යාල පණත

### 4 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පයත විස්තර කර තිබෙන ඉඩම විද්‍යොදය විශ්ව විද්‍යාලය සඳහා අවශ්‍ය බව 1958 අංක 45 දරණ විද්‍යොදය විශ්ව විද්‍යාලය හා විද්‍යාලංකාර විශ්ව විද්‍යාලය පණතේ 4 වෙනි වගන්තිය යටතේ අධ්‍යාපන ඇමතිවරයා වූ බදිඋද්දීන් මහමූද් නමැති මම මෙයින් දනුම්දි සිටිමි.

පහත සඳහන් අන්දමට මායිම්වී ඇති, කරපිංචගහ කුරුඳුවත්ත නැමැති ඉඩමෙන් අක්කර 6, රූඩ් 2ක් ප්‍රමාණයක් ඇති ඉඩම් කොටස :—

උතුරට : විද්‍යොදය විශ්ව විද්‍යාලයට අයිති ඉඩම ; නැගෙනහිරට : ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවට අයත් පාර ; දකුණට : විද්‍යොදය විශ්ව විද්‍යාලයට අයිති ඉඩම ; බස්නාහිරට : විද්‍යොදය විශ්ව විද්‍යාලයට අයිති ඉඩම.

බදිඋද්දීන් මහමූද්,
අධ්‍යාපන ඇමති.

අංකය : ඉ2/කෝ සී/14

1962 සැප්තැම්බර් මස 28 වෙනි දින,
කොළඹ 3 හිදීය.

10-1016

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49. ඡෙදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡෙදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උප ලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුලත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමතිතුමා.

1962.10.12 වෙනි දින දීය.
කොළඹ 2.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ආදායම් නිලධාරි කොට්ඨාශයේ, කොල්ලුපිටිය ගම්මුලාදෑනි වසමේ චාල්ස් ඩරයිව් හි චරිපනම් අංක 2 දරණ ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති පර්චස් 75 ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට : කොල්ලුපිටියේ 5 වෙනි පටුමග ; නැගෙනහිරට : චාල්ස් වේ ; දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස ; බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කොටස.

10-864

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡෙදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡෙදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උප ලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡෙදයෙහි අදහසට ඇතුලත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමතිතුමා.

1962.10.10 වෙනි දින දීය.
කොළඹ 2.

### උපලේඛනය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඩ විල්ලි හත්පත්තුව ආදායම් නිලධාරි කොට්ඨාශයේ අරම්පොල ගම්මුලාදෑනි වසමේ පිහිටි "සී ටිල්ඩ් වත්ත" නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කර 5ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට : විදුලි කම්බි ඇදීම සඳහා වෙන්කර ඇති ඉඩම් කොටස ; නැගෙනහිරට : එම ඉඩමේ ඇති පාර ; දකුණට : නුවර-කුරුණෑගල ප්‍රසිද්ධ පාර ; බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කොටස.

10-865

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඒ දරණ ඡෙදය යටතේ ප්‍රකාශනයයි

පළාත් පාලන සහ නිවාස ඇමතිවර මහානාම සමරවීර වන මම, 1958 අංක 42 දරණ පනතින් සංශෝධනය කරන ලද 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49ඒ (1) (සී) ඡෙදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මේ සමග ඇති උපලේඛනයෙහි විස්තර කර ඇති ස්ථානය එම ඡෙදයෙහි සඳහන් අරමුණ සඳහා අත්කර ගැනීමට අවශ්‍ය බව මෙයින් ප්‍රකාශ කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමතිතුමා.

1962.10.12 වෙනි දින දීය.
කොළඹ 2.

### උපලේඛනය

වයඹ පළාතේ හලාවත දිස්ත්‍රික්කයේ පිටිගල් කෝරළය දකුණ ආදායම් නිලධාරි කොට්ඨාශයේ අංක 502 දරණ ඉහළ කොට්ටාරමුල්ල ගම්මුලාදෑනි වසමේ පිහිටි මාදම්ගහකුඹුර නොහොත් තිත්තගොල්ල කොටුව නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති පර්චස් 27 ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට : එම ඉඩමේ ඉතිරි කොටස ; නැගෙනහිරට : ගම්සභා පාර ; දකුණට : පුද්ගලික ඉඩම් ; බස්නාහිරට : මාදම්පෙ-දන්කොටුව ප්‍රසිද්ධ පාර.

10-866

---

ඇල්.ඩී.—බී. 20/61.

## 1961 අංක 28 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත

1961 අංක 28 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 68 වෙනි වගන්තිය යටතේ වානිජ, වෙළෙඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවනු ලබන නියෝග.

ටී. බී. ඉලංගරත්න,
වාණිජ, වෙළෙඳ, ආහාර හා නැව් කටයුතු
පිළිබඳ ඇමති.

1962 අප්‍රියෙල් මස 6 වෙනි දින,
කොළඹදීය.

### නියෝග

1. මේ නියෝග ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා නියෝග අංක 2 වශයෙන් හැඳින්විය හැකිය.

2. පනතේ 42 වෙනි වගන්තිය යටතේ බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින්, යම් දේපළක අයිතිකරුට හෝ එය පාලනය කරන හෝ එය භුක්ති විඳින හෝ එහි ස්වාමිත්වය දරන තැනැත්තාට, ඔහු විසින් අත්සන් කරන ලද දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසු හෝ ඒ දේපළෙහි හෝ ඊට නුදුරුව ප්‍රකට ස්ථානයක ඒ දැන්වීම ප්‍රදර්ශනය කරවීමෙන් පසු යථෝක්ත වගන්තියෙන් හෝ මේ නියෝග වලින් ඔහු වෙත පැවරි ඇති බලතල සියල්ල හෝ ඉන් යමක් ඕනෑම අවස්ථාවකදී පාවිච්චි කළ හැකිය.

3. පනතේ 42 වෙනි වගන්තිය යටතේ බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් ඔහුගේ බලතල සියල්ල හෝ ඉන් යමක්, පාවිච්චි කිරීමේ කාර්‍ය්‍ය සඳහා අවශ්‍ය විය හැකි තැනැත්තන්, ආයුධ, ආම්පන්න සහ වාහන ඇතිව ඉහතකී දේපළට ඇතුළුවී එය පරීක්ෂා කිරීම, මැනීම, මායිම් වෙන් කිරීම සහ ඒ දේපළ පිළිබඳව අවශ්‍ය විය හැකි සෑම පියවරක්ම ගැනීම ද කළ හැකිය.

4. යම් දේපළක අයිතිකරුගේ සහ ඒ දේපළ පාලනය කරන, භුක්ති විඳින හෝ එහි ස්වාමිත්වය දරන සෑම තැනැත්තෙකුගේම යුතුකම—

(අ) පනතේ 42 වෙනි වගන්තිය යටතේ බලය පවරනු ලැබූ තැනැත්තන් විසින් නියම කරනු ලැබිය හැකි තොරතුරු ඔහු වෙත සැපයීම ;

(ආ) ඒ දේපළට අදාළ තොග පොත්, ගණන් පොත්, බඩු ලේඛන, බිල් පත්‍ර, ඉන්වොයිස් පත්‍ර, ඔප්පු සහ වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම ; සහ

(ඇ) 42 වෙනි වගන්තිය යටතේ බලය පවරනු ලැබූ තැනැත්තාට හෝ තැනැත්තන් හට අවශ්‍ය විය හැකි සහාය දීම විය යුතුය.

5. පනතේ 42 වෙනි වගන්තිය යටතේ වූ බලතල සියල්ල හෝ ඉන් යමක් පාවිච්චි කිරීමේ කාර්‍ය්‍ය සඳහා එකී වගන්තිය යටතේ බලය පවරනු ලැබූ තැනැත්තා හෝ තැනැත්තන් විසින්—

(අ) යම් තැනැත්තකු විසින් හෝ ආයතනයක් විසින් තබනු ලබන්නාවූ හෝ පවත්වා ගෙන යනු ලබන්නාවූද යම්

දේපළකට අදාළවූද වාර්තාවක්, ලේඛනයක්, පොතක් හෝ ඔප්පුවක් ඉල්ලා සිටීම, පරීක්ෂා කිරීම සහ එහි පිටපත් ලබා ගැනීමද,

(ආ) ඒ දේපළට අදාළ යම් තොරතුරක් නියමිත දිනයකට පෙර ඉදිරිපත් කරන ලෙස යම් තැනැත්තකුට නියම කිරීමද,

6. මේ නියෝගවල, පද සංසන්දනයෙන් වෙනත් අර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, "පනත" යනුවෙන් 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත අදහස් වේ; තවද

"දේපළ" යනුවෙන් ඛනිජ තෙල් මෙරටට ගෙන්වීම, පිටරට පැටවීම, රැස්කිරීම, අලෙවි කිරීම, සැපයීම හෝ බෙදා හැරීම සඳහා හෝ එසේ මෙරටට ගෙන්වීමට, පිටරට පැටවීමට, රැස්කිරීමට, අලෙවි කිරීමට, සැපයීමට හෝ බෙදා හැරීමට ආනුෂංගික විය හැකි හෝ උපකාරී විය හැකි වෙනත් ව්‍යාපාර පවත්වා ගෙන යාම සඳහා යොදනු ලැබූ හෝ යොදනු ලබන හෝ යෙදවීමට අදහස් කරනු ලබන හෝ යෙදවීමට අදහස් කරනු ලැබූ යම් චංචල හෝ නිශ්චල දේපළක් අදහස් වේ.

10-465/1

---

ඇල්.ඞී.—බී. 20/61.

## 1961 අංක 28 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත

1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 34(9) වෙනි හා 68 වෙනි වගන්ති යටතේ වාණිජ, වෙළෙඳ, ආහාර සහ නැව් කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවනු ලබන නියෝග.

ටී. බී. ඉලංගරත්න,
වාණිජ, වෙළෙඳ, ආහාර හා නැව් කටයුතු
පිළිබඳ ඇමති.

1962 අප්‍රියෙල් මස 6 වෙනි දින,
කොළඹදීය.

### නියෝග

1. මේ නියෝග ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා නියෝග අංක 3 වශයෙන් හැඳින්විය හැකිය.

2. දැනුම් දෙනු ලැබූ යම් දේපළක් පරීක්ෂා කොට ඒ පිළිබඳව තත්ව වාර්තාවක් සකස් කරන ලෙස සංස්ථාවේ යම් නිලධාරියෙකුට හෝ වෙනත් තැනැත්තකුට සංස්ථාව විසින් බලය පැවරිය හැකිය.

3. 2 වෙනි නියෝගය යටතේ බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් දැනුම් දෙනු ලැබූ දේපළ අයිතිකරුට හෝ එය පාලනය කරන හෝ එය භුක්ති විඳින හෝ එහි ස්වාමිත්වය දරන තැනැත්තාට ඔහු විසින් අත්සන් කරන ලද දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසු හෝ ඒ දේපළෙහි හෝ ඊට නුදුරුව ප්‍රකට ස්ථානයක ඒ දැන්වීම ප්‍රදර්ශනය කරවීමෙන් පසු මේ නියෝග වලින් ඔහු වෙත පැවරී ඇති බලතල සියල්ල හෝ ඉන් යමක් ඕනෑම අවස්ථාවකදී පාවිච්චි කළ හැකිය.

4. 2 වෙනි නියෝගය යටතේ බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් ඔහුගේ බලතල සියල්ල හෝ ඉන් යමක් පාවිච්චි කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි තැනැත්තන්, ආයුධ, ආම්පන්න සහ වාහන ඇතිව ඉහතකී දැනුම් දෙනු ලැබූ දේපළ ඇතුළු වී එය පරීක්ෂා කිරීම, මැනීම, මායිම් වෙන් කිරීම සහ ඒ දැනුම් දෙනු ලැබූ දේපළ පිළිබඳ අවශ්‍ය විය හැකි සෑම පියවරක්ම ගැනීමද කළ හැකිය.

5. දැනුම් දෙනු ලැබූ යම් දේපළක අයිතිකරුගේ සහ ඒ දේපළ පාලනය කරන, භුක්ති විඳින හෝ එහි ස්වාමිත්වය දරන සෑම තැනැත්තකුගේම යුතුකම—

(අ) 2 වෙනි නියෝගය යටතේ බලය පවරනු ලැබූ තැනැත්තා විසින් නියම කරනු ලැබිය හැකි තොරතුරු ඔහු වෙත සැපයීම;

(ආ) දැනුම් දෙනු ලැබූ යම් දේපළකට අදාළ තොග පොත්, ගණන් පොත්, බදු ලේඛන, බිල් පත්‍ර, ඉන්වොයිස් පත්‍ර, ඔප්පු සහ වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම; සහ

(ඇ) 2 වෙනි නියෝගය යටතේ බලය පවරනු ලැබූ තැනැත්තාට, පනත යටතේ හෝ මේ නියෝග යටතේ ඔහු වෙත පවරනු ලැබූ හෝ පනවනු ලැබූ බලතල පාවිච්චි කිරීම හා යුතුකම් ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි අන්දමින් සහාය දීම විය යුතුය.

6. මේ නියෝග යටතේ තත්ව වාර්තාවක් සකස් කිරීමේ කාර්‍ය්‍යය සඳහා, 2 වෙනි නියෝගය යටතේ බලය පවරනු ලැබූ මේ තැනැත්තකු විසින්—

(අ) යම් තැනැත්තකු විසින් හෝ ආයතන විසින් තබනු ලබන්නා වූ හෝ පවත්වා ගෙන යනු ලබන්නාවූද දැනුම්දෙනු ලැබූ යම් දේපළකට අදාළ වූද යම් වාර්තාවක්, ලේඛනයක් හෝ පොතක් ඉල්ලා සිටීම, පරීක්ෂා කිරීම හා එහි පිටපත් ලබා ගැනීමද,

(ආ) දැනුම් දෙනු ලැබූ යම් දේපළකට අදාළ වන යම් තොරතුරක් නියමිත දිනයකට පෙර ඉදිරිපත් කරන ලෙස යම් තැනැත්තෙකුට නියම කිරීමද කළ හැකිය.

7. 2 වෙනි නියෝගය යටතේ බලය පවරනු ලැබූ තැනැත්තා විසින් තත්ව වාර්තාව සකස් කොට අවසානයේදි ඒ වාර්තාවට අදාළ වන දැනුම් දෙනු ලැබූ යම් දේපළ අයිතිකරුට හෝ එය පාලනය කරන හෝ භුක්ති විඳින හෝ එහි ස්වාමිත්වය දරන තැනැත්තාට වාර්තාවේ පිටපතක් භාර දිය යුතුය. ඒ තත්ව වාර්තාවේ පිටපතක් ඒ දේපළ පිහිටා තිබෙන ස්ථානයෙහිදීද ලබා ගත හැකි විය යුතුය.

8. ඒ වාර්තාව ගැන තමාගේ එකඟත්වයක් ඇතිද නැතිද යන වග සංස්ථාව වෙත වහාම නිවේදනය කිරීම ඒ වාර්තාවේ පිටපතක් භාර දෙනු ලැබූ සෑම තැනැත්තෙකුගේම යුතුකම විය යුතුය.

9. එබඳු යම් තැනැත්තකු එවැනි වාර්තාවක් පිළිබඳව එකඟත්වයක් නොමැති විටෙක තමාට තිබිය හැකි විරුද්ධතාවන්ද ඒ විරුද්ධතාවන් ඇතිවීමට හේතුද ලියවිල්ලක සඳහන් කොට සංස්ථාව වෙත නිවේදනයක් යැවීමත්, ඒ විරුද්ධතාවන් සනාථ කිරීම පිණිස තමා උපයෝගී කර ගන්නා සියලු ලේඛන හා වෙනත් කරුණු ඉදිරිපත් කිරීමත් ඒ තැනැත්තාගේ යුතුකම විය යුතුය.

10. දැනුම් දෙනු ලැබූ යම් දේපළක් පිළිබඳව තත්ව වාර්තාවක් පිළියෙල කරගෙන යනු ලැබේද, ඒ දේපළෙහි භුක්තිය සංස්ථාව සඳහා අත්කරගනු ලැබූ විට හෝ සංස්ථාව වෙත ඒ දේපළ පවරා ගනු ලැබූ විට, දැනුම් දෙනු ලැබූ ඒ දේපළෙහි භුක්තිය සංස්ථාව සඳහා අත් කර ගෙන ඇති බව හෝ ඒ දේපළ සංස්ථාව වෙත පවරා ගෙන ඇති බව නොසලකා, 2 වෙනි නියෝගය යටතේ බලය පවරනු ලැබූ තැනැත්තා විසින් මේ නියෝගය යටතේ තත්ව වාර්තාව පිළියෙල කිරීම සඳහා වූ කටයුතු නොකඩවා කර ගෙන යා යුතුය. තවද 2 වෙනි නියෝගය යටතේ බලය පවරනු ලැබූ තැනැත්තා විසින් ඒ තත්ව වාර්තාව අත්සන් කරනු ලැබූ විට, සංස්ථාව සඳහා භුක්තිය අත් කර ගෙන ඇති හෝ සංස්ථාව වෙත පවරා ගෙන ඇති යම් දේපළක තත්වය පිළිබඳව සංස්ථාව විසින් හෝ සංස්ථාවේ බලය යටතේ හෝ සකස් කරනු ලැබූ වාර්තාවක් ලෙස එය සැළකිය යුතුය.

11. මේ නියෝගවල පද සංසන්දනයෙන් වෙනත් අර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, "පනත" යනුවෙන් 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත අදහස් වේ;

"සංස්ථාව" යනුවෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අදහස් වේ; තවද

"දැනුම් දෙනු ලැබූ දේපළ" යන්නෙහි 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතෙහි දී ඇති අර්ථයම ඇත.

10-465/2

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## කළුතර දිස්ත්‍රික්කයේ 1963 වර්ෂයට තුවක්කු බලපත්‍ර අළුත්කිරීම

කළුතර දිස්ත්‍රික්කයේ තුවක්කු තබාගැනීමේ බලපත්‍ර 1963 වර්ෂය සඳහා අළුත් කිරීම 1962.11.1 වෙනි දින සිට ඒ ඒ කොට්ඨාශවල ප්‍රාදේශිය ආදායම් නිලධාරීන් විසින් කරගෙන යනු ලැබේ. මේ සම්බන්ධයෙන් ඉල්ලුම් පත්‍ර ප්‍රාදේශිය ආදායම් නිලධාරීන් වෙත යැවිය යුතු නමුත් මෙම දිස්ත්‍රික්කයට අළුතෙන් පදිංචියට පැමිණ සිටින බලපත්‍ර හිමියන් විසින් පමණක් මෙම කාර්‍ය්‍යාලයෙන් ඉල්ලුම් කළ යුතුය. තුවක්කු තබාගැනීම සඳහා දෙන ලද සෑම බලපත්‍රයක්ම 1962 දෙසැම්බර් මස 31 වෙනි දිනට ප්‍රථම අළුත්කළ යුතුයි. මෙසේ අළුත් කිරීමේදී 1962 වර්ෂයට අයත් බලපත්‍රය සමග ඊට අයිති තුවක්කුව, බලපත්‍ර අළුත් කරන නිලධාරිතැන වෙත ඉදිරිපත් කළ යුතුයි. ඉහත සඳහන් දිනෙන් පසු බලපත්‍ර අළුත් කරන අය බලපත්‍ර ගාස්තුව හා ඊට සමාන දඩ මුදලක් ගෙවිය යුතු බව මෙයින් දැනුම් දෙමි.

2. යම් තුවක්කු බලපත්‍රයක් 1963 වර්ෂයට අළුත් නොකිරීමට බලාපොරොත්තුවේ නම් එකී බලපත්‍රය හා ඊට අයිති තුවක්කුවද බලපත්‍ර අළුත් කරන නිලධාරිතැනට හෝ මෙම කාර්‍ය්‍යාලයට 1962 දෙසැම්බර් මස 31 වෙනි දින හෝ ඊට පෙර භාරදිය යුතුය.

3. 1963 අප්‍රියෙල් මස 1 වෙනි දිනට පෙර අළුත් නොකරන ලද සෑම බලපත්‍රයක් සඳහාම නඩු පවරන බව මෙයින් දැනුම් දෙමි.

ඩබ්ලිව්. පතිරණ,
කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත

1962 ක්වූ ඔක්තෝබර් මස 15 වෙනි දින,
කළුතර කච්චේරියේදීය.

10-887

## 1963 වර්ෂය සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ තුවක්කු බලපත්‍ර අලුත්වැඩියා කිරීම

1963 වර්ෂය සඳහා තුවක්කු බලපත්‍ර අලුත්වැඩියා කිරීම 1962ක්වූ නොවැම්බර් 15 වෙනි දින ආරම්භ කරනවා ඇත. තුවක්කු අයිතිකරුවන් තමන් පදිංචි ප්‍රදේශය භාර ආදායම් නිලධාරි තුමන්ගේ කාර්යාලවලින් බලපත්‍ර අළුත්වැඩියා කරගත යුතුයි. මහනුවර නාගරික සභාවට සහ ගඟවට කෝරළේට අයත් බලපත්‍ර මහනුවර කඩවත් හතරේ සහ ගඟවට කෝරළේ කරවන ආදායම් නිලධාරි තුමා වෙත යැවිය යුතුයි. මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශ භාර ආදායම් නිලධාරීන්ගේ ලිපිනයන් පහත දැක්වේ :—

(අ) මහනුවර කඩවත් සතරේ හා ගඟවට කෝරළේ ප්‍රාදේශිය ආදායම් නිලධාරි, ලේකම් කාර්යාලය, මහනුවර.

(ආ) පාතහේවාහැට ප්‍රාදේශිය ආදායම් නිලධාරි, කැටවල, ලෙව්ල.

(ඉ) පාතදුම්බර ප්‍රාදේශිය ආදායම් නිලධාරි, ලෙයිඩන් බංගලාව, කටුගස්තොට.

(ඊ) උඩබුලත්ගම ප්‍රාදේශිය ආදායම් නිලධාරි, නාවලපිටිය.

(උ) උඩුනුවර හා යටිනුවර ප්‍රාදේශිය ආදායම් නිලධාරි, ඊරියගම, පේරාදෙණිය.

(ඌ) උඩපලාත ප්‍රාදේශිය ආදායම් නිලධාරි, ගම්පල.

(එ) උඩදුම්බර ප්‍රාදේශිය ආදායම් නිලධාරි, මාඩුගොඩ.

(ඒ) තුම්පනේ ප්‍රාදේශිය ආදායම නිලධාරි, ගලගෙදර.

(ඔ) හාරිස්පත්තුව ප්‍රාදේශිය ආදායම නිලධාරි, සීගිරි ගොඩනැගිල්ල, කටුගස්තොට.

(ඔ) මැදදුම්බර ප්‍රාදේශිය ආදායම නිලධාරි, තෙල්දෙණිය.

2. තුවක්කු බලපත්‍ර අළුත්වැඩියා කිරිම සඳහා මුද්දර භාරගනු නොලැබේ. බලපත්‍ර නැතිවූවිට රුපියලක් ගෙවා මහනුවර දිසාපතිගෙන් පිට පතක් ලබාගත යුතුයි. පසුවූ වර්ෂයේ බලපත්‍රය හෝ එහි පිටපතක් ඉදිරිපත් නොකරන අයට අළුත් බලපත්‍ර නිකුත් කරනු නොලැබේ. 1962 දෙසැම්බර් 31 වෙනිදාට ප්‍රථමයෙන් නව වර්ෂය සඳහා අළුත් බලපත්‍රයක් නොගන්නා අයට බලපත්‍රයේ ගාස්තුවට සමාන දඩ මුදලකට යටත්වන්ට සිදුවේ. 1963 මාර්තු 31 වෙනි දින දක්වා ප්‍රාදේශිය ආදායම නිලධාරීන් විසින් ඉහතකී දඩ මුදල් අයකර බලපත්‍ර අළුත් වැඩියා කරනු ලැබේ. 1963 මාර්තු 31 වෙනි දිනට ප්‍රථම බලපත්‍ර අළුත් වැඩියා නොකල අයට නිති මාර්ගයෙන් දඩුවම් පමුණුවනු ලැබේ.

3. යම තුවක්කුවක් පාවිච්චි නොකලහැකි තත්වයක තිබේනම් 1962 වර්ෂයට නිකුත්කරන ලද බලපත්‍රයත් සමග කච්චේරියට හෝ ගම්මුලාදැනියාට හෝ ලඟම ඇති පොලිසියට 1962 දෙසැම්බර් 31 වෙනිදාට ප්‍රථමයෙන් භාරදිය යුතුයි. එසේ භාර දීමට සිදුවුවහොත් ගම්මුලාදැනි තැනගෙන් හෝ පොලිස් නිලධාරිතැනගෙන් එම තුවක්කුව ලැබුනු බවට කුවිතාන්සියක් ලබාගත යුතුයි. එය එසේ භාර නොදුන්න හොත් 1963 වර්ෂය සඳහා ගෙවිය යුතු ගාස්තුව ගෙවා බලපත්‍ර අළුත් වැඩියා කර ගැනිමට සිදුවේ.

සී. ජේ. සේරසිංහ,
මහනුවර දිසාපති.

1962ක්වූ ඔක්තෝබර් මස
මහනුවර කච්චේරියේදීය.
10-1030

## ත්‍රිකුණාමලයේ සංචාරක මධ්‍යස්ථානය

ත්‍රිකුණාමලයේ සංචාරක මධ්‍යස්ථානය සංචාරක බංගලාවක් හැටියට වර්ගකර 1962 ඔක්තෝබර් මස 19 වෙනි දින සිට එක් අයෙකුගෙන් එක් දිනකට හෝ ඉන් කොටසකට රුපියල් 3 බැගින් අයකරණු ලබන බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආර්. ඒ. ඇම්. සී. ඇස්. සේනාරත්න,
රජයේ දේශ සංචාරක කායර්‍යාංශයේ
වැඩබලන අධ්‍යක්ෂ.

15.10.62,
රජයේ දේශ සංචාරක කායර්‍යාංශය,
කොළඹ 1.
10-883

## දැන්වීමයි

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙණිය හත්පත්තුව කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ මැදගොඩ ගම්පති කොට්ඨාශයේ මැදගොඩ ගමේ ගවයින් අතර, "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැව් 1957 තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ (1) අතුරු වගන්තිය යටතේ මා විසින් වර්ෂ 1962. 8.24 දින අංක 13,272 දරණ ආණ්ඩුවේ ගැසැට් පත්‍රයේ ප්‍රසිඩ කරන ලද දැන්වීම අද දින සිට අවලංගු වන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි.

1962 ඔක්තෝබර් 19 වැනි දින,
පේරාදෙණියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
කායර්‍යාලයේ දීය.
10-1023

## ලංකා දුම්රිය සේවය

### දුම්රිය මාර්ගය හරහා මහා මාර්ගය වැටී ඇති ස්ථාන අළුත්වැඩියා කිරීම

කැලණිවැලි දුම්රිය මාර්ගයේ නාරාහේන්පිට සහ කිරිල්ලපොන දුම්රිය ස්ථාන අතර සැ. 3 [illegible] 49 පුරුක් 87 දරණ ස්ථානයෙන් ජාතික කිරි මණ්ඩල මාවත වැටී ඇති ස්ථානය අළුත්වැඩියා කිරීම සඳහා මෙම ඔක්තෝබර් මස 28 වැනි ඉරිදා පස්වරු 5 සිට 10 දක්වා රථ වාහන ගමනාගමනය අවුරාලීමට අර්ධ වශයෙන් වසාතබන අතර එදින රාත්‍රි 10 සිට පසුදින උදේ 6 දක්වා සම්පූර්ණයෙන් වසාතබනු ලැබේ.

මේ කාලය තුළදී රථ වාහන වෙනත් මාර්ගයන්ගෙන් ධාවනය කර වියයුතුය.

10-1056

## රථ වාහන ගමනාගමනයට බාධා

### උතුරු කොළඹ දිස්ත්‍රික්කයේ කටුනායක හලිගස්තොට පාර

ඉහත සඳහන් මාර්ගය 62.10.29 වැනි දින සිට, නැවත දන්වන තුරු රථ වාහන ගමන් කළ නොහැකි වන සේ වසා තබන බැව්, මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කටුනායක සිදුව හල්ගස්තොට මාර්ගය ඒ වෙනුවට යොදා ගත හැකිය.

ඒ. සී. පෙරේරා,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

1962 ඔක්තෝබර් 22 දින,
කොළඹ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේදීය.
10-1086

**සැම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිඩ නිවාඩු දින අතරට පැමිණෙන සැම සතියකදීම පළ කරන දිනය වෙනස් විමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායකමුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායකමුදල් භාරගනු නොලැබේ.**

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි.